එකිනෙකාට බැණ ගන්නා දෙදෙනකු වනාහි, (එහිදී) අසාධාරණයට ලක්වන්නා ඉක්මවා යන තෙක් ඔවුන් දෙදෙනාගෙන් ආරම්භ කළ අය වෙත ඔවුන් දෙදෙනා පවසන දෑ (පාපය) පිහිටයි.

නියත වශයෙන්ම අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා පැවසූ බව අබූ හුරෙය්රා -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදි. “එකිනෙකාට බැණ ගන්නා
දෙදෙනකු වනාහි, (එහිදී) අසාධාරණයට ලක්වන්නා ඉක්මවා යන තෙක් ඔවුන් දෙදෙනාගෙන් ආරම්භ
කළ අය වෙත ඔවුන් දෙදෙනා පවසන දෑ (පාපය) පිහිටයි.“ [පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් මුස්ලිම් එය වාර්තා කර ඇත]

බැණ ගන්නා දෙදෙනකු තුළින් පිට වන සියලු පාපයන්, නියත වශයෙන්ම එහි පාපය ඔවුන් දෙදෙනාගෙන් ආරම්භ කළ අය මත පිහිටයි. හේතුව එම ක්රියාවෙන් ඉක්මවා ගිය අය එය ආරම්භ කළ තැනැත්තා වන බැවිනි. නමුත් අනෙකා වෙත කිසිවක් පිහිටන්නේ නැත. හේතුව තමන්ට අපරාධ කළ අයට ප්රතිචාර දැක්වීමට ඔහුට අවසරය ලබා දෙන බැවිනි. අපරාධයට ලක්වූ තැනැත්තා අපරාධකරුට සීමාව ඉක්මවා යමින්, එනම් අනුමත ප්රතිචාරයට වඩා ඉක්මවා ගොස් බැණ වදින්නේ නම් ආරම්භ කළ තැනැත්තාගේ පාපයට වඩා අපරාධයට ලක් වූ තැනැත්තාට විශාල පාපයක් අත්වන්නේය.

https://sunnah.global/hadeeth/si/show/8878